# ප්‍රථම බස/මවුබස භාවිතා කිරීම ඉංග්‍රීසි භාෂාව ඉගෙනීම සඳහා ශක්තිමත් අත්තිවාරමක් සපයයි.




නිවසේදී ඉගෙන ගන්නා ප්‍රථම භාෂාව ඉතා වැදගත් වන අතර එය පසු කාලීන භාෂා වර්ධනයට අඩිතාලම සකස් කරනු ලැබේ.

දරුවන්ට එක් භාෂාවකට වඩා සවන් දීමට හා සන්නිවේදනය කිරීමට අවස්ථාවන් ඇත්නම් ඔවුන් ඉතා පහසුවෙන් භාෂා දෙකක් (හෝ ඊට වැඩි ප්‍රමාණයක්) ඉගෙන ගනී.



දෙමාපියන්, පවුලේ සාමාජිකයන් හා අධ්‍යාපකයන් මවුබස වැඩිදියුණු කිරීමට හා පවත්වා ගෙන යාමට ඉතා වැදගත් බලපෑමක් ඇති කරයි. දෙමාපියන් තම දරුවන් සමඟ කතා බස් කරන විට ඉංග්‍රීසි බස පාවිච්චි නොකර මවුබස නොකඩවා භාවිතා කිරීමෙන් ඊට උදවු දිය හැක.

මවුබස භාවිතා කර පවත්වාගෙන යාමේ වැදගත්කමට හේතු ගණනාවක් ඇත.

- දරුවන් තම මවුබස හොඳින් භාවිතා කරන විට දෙවෙනි භාෂාවක් ඉගෙනීම පහසු වේ.
- මවු බස පවත්වා ගෙන යාම සුරක්ෂිතභාවය, සංස්කෘතිය හා පවුලේ සම්බන්ධකම් ඇති කිරීම පිණිස අත්‍යාවශ්‍ය වේ.
- භාෂා කිහිපයක් දැන සිටීම දරුවන්ගේ චින්තනයේ නම්‍යශීලි බව ඉතා හොඳින් වැඩිදියුණු කිරීමට රුකුලක් වන අතර එය ඔවුන්ගේ ඉගෙනීමට, ගැටළු නිරාකරණය කිරීමට සහ අධ්‍යාපන ජයග්‍රහණ අත්පත් කර ගැනීමට අවශ්‍ය ආකල්ප සඳහා ධනාත්මක බලපෑම් අති කරයි.



දරුවන් විවිධ අවස්ථාවල හා විවිධ අරමුණු සඳහා භාවිතා කරන තම මවු බසට ඇහුම්කන්දිය යුතු වේ. එමගින් ඔවුන්ට තම අනන්‍යතාවය දියුණු කර ගත හැකි අතර ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමට අවශ්‍ය ශක්තිමත් අත්තිවාරමක් ලබාදේ.



# මුල් ළමා අවධියේදී ඉංග්‍රීසි භාෂාව අතිරේක භාෂාවක් ලෙස ඉගෙන ගැනීම.

දරුවන්ට මුල් ළමා අවධියේදී ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීමට බොහෝ අවස්ථා ඇත.

දරුවන් විවිධ අවස්ථාවන්හිදී භාවිතා කරන ඉංග්‍රීසි භාෂාවට සවන්දීමෙන් ඉතා ඉක්මනින් තම පරිසරයට හුරු වේ. ඔවුනට අනෙකුත් දරුවන් සමඟ සෙල්ලම් කිරීමට අවශ්‍ය වේ. අධ්‍යාපකයන් විසින් දරුවන් හට ඉංග්‍රීසි භාෂාවට සවන් දීමට හා භාවිතා කිරීමට විවිධ අවස්ථා හා ආකෘතීන් ලබාදේ. අධ්‍යාපකයන් විසින් දරුවන්ට ඉංග්‍රීසි භාෂාව ක්‍රමිකව තේරුම් ගැනීමට අවශ්‍ය අනුබලය හා මඟ පෙන්වීමද ලබාදේ.

දරුවන් තම භාෂා කුසලතාවයන් දියුණු කරගනු ලබන්නේ තමන්ට ආවේණික වූ විලාශයෙනි. කිසියම් කාල පරතරයක් තුළ එකම අවස්ථාවේ භාෂා දෙකක් ඉගෙන ගන්නා දරුවන් එක් භාෂාවක් අනෙක් භාෂාවට වඩා හොඳින් කතා කරයි. මුල් කාලයේදී ඔවුන් කතා කරන විට භාෂා දෙක සංකලනය කර ගනී. ඔවුන් ඇතැම් වචන එක භාෂාවකින් දන්නා අතර අනෙකින් නොදනී. තම සංවාදනයන් ඉතා හොඳින් පවත්වා ගෙන යාම සඳහා ඔවුන් තමන් දන්නා වචන භාවිතා කරයි.

දෙමව්පියන් තම දරුවන් ඉංග්‍රීසි භාෂාව අතිරේක භාෂාවක් ලෙස ඉගෙන ගන්නා කාලයේදී ඔවුන් සමඟ නොකඩවා මවුබසින් කතා කිරීම වැදගත් වේ. මෙය තම දරුවන්ට මවුබස දියුණු කර ගැනීමට සහ පවත්වා ගෙන යාමට රුකුලක් වේ.










Ground Floor, 9-11 Stewart Street
Richmond, 3121
tel: +61 3 9428 4471
fax: +61 3 9429 9252
email: fkacs@fka.org.au
web: www.fka.org.au
FKA Children's Services Inc. 215663278505573

fka CHILDREN'S SERVICES INC
Incorporating Multicultural Resource Centre